**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, දීර්ඝ වෙලාවකින් පසුව හෝ මට වෙලාව ලබා දීම පිළිබඳව. ඔබතුමා දන්නවා, ඇත්තටම මම මේ ප්‍රකාශය කරන්න උත්සාහ දැරුවේ අය වැය විවාදයේ අවසාන දවස වුණු දෙසැම්බර් 13 වැනි දා බව. එදා මම ඔබතුමා ළඟට ආවා. ඇවිල්ලා, කාලය ඉල්ලුවා. හැබැයි, ඒ වෙලාවේ, ඒ මොහොතේ මම මේ ප්‍රකාශය සිදු කළා නම්, මම පක්ෂ ද්‍රෝහියෙක් බවට පත් වෙනවා. ඒ නිසායි මම කාලය අරගෙන අද දිනයේ මේ ප්‍රකාශය කරන්න ඉල්ලීමක් කළේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මම අටවැනි පාර්ලිමේන්තුව සහ නවවැනි පාර්ලිමේන්තුව -අවුරුදු අටකට ආසන්න කාලයක්- නියෝජනය කර තිබෙනවා. මම හිතනවා, මගේ දේශපාලන ජීවිතය තුළ මට ඡන්දය ලබා දුන් ජනතාව වෙනුවෙන් උපරිම සේවයක් සිද්ධ කළා කියා. නමුත් ගරු කථානායකතුමනි, මම අවස්ථා ගණනාවකදී පෞද්ගලිකව මුහුණ දුන් කාරණා කිහිපයක් තිබෙනවා. ඒ සමහර කාරණා ඔබතුමාත් දන්නවා. මම දවල් 11.00 - 12.00 වෙන කොට මේ සභාවේ නැති බව ඔබතුමා දන්නවා. නමුත් මම උදේම එනවා. මම උදේට ඇවිත් ප්‍රශ්න අහනවා; කථා කරනවා.

මට දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. එයින් දෙදෙනෙක් පෙර පාසල් යනවා. ඒ දරුවන් පෙර පාසලට එක්ක යන්නත්, නැවත එක්කගෙන එන්නත් මම ඇබ්බැහි වෙලා තිබෙනවා. ඒ, මගේ දරුවෝ නිසා මට එහෙම යන්න වෙලා තිබෙනවා.

මා ඒ නිසා සමාජයේ ඇති වන බරපතළ ප්‍රශ්නවලට මුහුණ දෙනවා. විශේෂයෙන්ම, ජනතා නියෝජිතයෙකු හැටියට. මේ 225දෙනා පිළිබඳව ගරු කථානායකතුමනි, මහා විශාල විධියේ එපා වීමක් රටේ සමාජය තුළ තිබෙනවා. පසුගිය දිනක දියවන්නාවේ කිඹුලෙකු ගොඩ වෙලා තිබුණා. විශාල ජන සංඛ්‍යාවක් එතැනට එකතු වෙලා -ඒක රාශි වෙලා- සිටියා. මමත් දන්නේ නැතුව එතැනට ගිහිල්ලා එබිකම් කළා. හැබැයි, ජනතාව ඒ වෙලාවේ කිඹුලාට කිව්වේ මොකක්ද? "ඒ 225දෙනාම කාපන්" කියලායි. ඒක ඒ කිඹුලාට ඇහෙන්නේ නැහැ, තේරෙන්නේ නැහැ. හැබැයි, මම ඒක අහගෙන හිටියා, ගරු කථානායකතුමනි.

මම 2006දී ප්‍රාදේශීය සභාවෙන්, නගර සභාවෙන් පාර්ලිමේන්තුවට ආවා. මම V8 එකකින් පාර්ලිමේන්තුවට ආවේ. නමුත් මට අද V8 එකක් නැහැ. මම මේ ජන සමාජයෙන් දොස් අහන ප්‍රශ්නය හමුවේ ජනතාව සමහර වෙලාවට මගේ දරුවන්ටත් ශාප කරනවා, ගරු කථානායකතුමනි. ඒ කියන්නේ, අපි 225දෙනාගේ දරුවන්ටත් ශාප කරන තැනට මේ රට පත්වෙලා තිබෙනවා. ඒක ඔබේත් අපේත් වැරදි නිසා වෙන්න ඇති. ඒ නිසා මේවා ඉවසාගෙන දේශපාලනය තුළ තවත් ඉදිරියට යනවාද නැද්ද කියන ප්‍රශ්නය බරපතළ ලෙස පෞද්ගලිකව මට පැනනැගුණු නිසා, ගරු කථානායකතුමනි, නවවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හැටියට ඉල්ලා අස්වීමේ ලිපිය මම ඔබතුමාට, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියට භාර දීලා තිබෙනවා. එය පිළිගන්න කියලා මම මුලින්ම ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ නීතිය, සම්ප්‍රදාය කොතෙක් තිබුණත් මේ කටයුතු සියල්ල නීතිගරුකව, සම්ප්‍රදායට අනුව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ අද මම මේ කථා කරන විධිය, මම කථා කරන කොට ඔය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හැසිරෙන විධිය පටිගත වෙනවා, ගරු කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි, ඒ සියලු දේ -කියන්නේ මොනවාද, කථා කරන්නේ මොනවාද කියන එක - record වෙනවා, ගරු කථානායකතුමනි. හැබැයි ඔබතුමා නීත්‍යානුකූල අවසරය දීලා තිබෙන්නේ, මේ මයික් එකට කථා කළොත් විතරක් හැන්සාඩ් එකට ලියන්න කියලායි. හැබැයි, ගරු කථානායකතුමනි, එක්තරා අවස්ථාවක ලියැවිලා තිබෙනවා, අපි නොකියපු දේවල්, හැන්සාඩ්වල. හැන්සාඩ්වල ලියැවිලා තිබෙනවා, මම මේ මයික් එකට කථා කරපු නැති දේවල්. එතකොට ගරු කථානායකතුමනි, ඒක බරපතළ කාරණයක්. හැන්සාඩ් එක කියන්නේ නීතිය ඉදිරියට ගෙන යන්න පුළුවන් එකක්. එවැනි අවස්ථාවලදී ඒවා සමහර තැන්වල වසන් කරපු කාරණා බොහොමයක් තිබෙනවා. මේවා හරි බරපතළ කාරණා. පසුගිය සතියේ අපි මුහුණ දුන්නු විශාල -බරපතළ- ප්‍රශ්න තිබෙනවා. ඒවා හමුවේ මම හිතුවා, මගේ මේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අත් හැරීම පිළිබඳව. විශේෂයෙන් ජනතාවගේ පැත්තෙන් ජනතාව හිතනවා මමත් වැරදිකාරයෙක් කියලා. ඒක නේ ඔබතුමා ඇතුළුව මමත් මේ 225දෙනා ඇතුළේ තියලා බණින්නේ. හැබැයි, මගේ හෘදය සාක්ෂියට එකඟව මම දන්නවා, මගේ දේශපාලන හැසිරීම මොකක්ද කියලා. ඒත්, මම කැමති නැහැ මගේ දරුවන්ට ශාප කරනවාට, මේ රටේ ජනතාව. මේ 225 අතර ඉතා සුළුතරයක් ඉන්නවා, කිසි වැරැද්දක්, හොරකමක්, වංචාවක් නොකරපු උදවිය. ඒ අයත් මා වාගේ ඇති; මගේ වාගේ මානසිකත්වයෙන් ඇති. හැබැයි, මම කරන දේ ඔවුන්ට කරන්න බැරුව ඇති. ගරු කථානායකතුමනි, මට හිතුණා මගේ දරුවන් ගැන හිතලා, එක පැත්තකින් මේ රටේ ජනතාව කරන ශාපයෙන් ඔවුන් මුදා ගන්න. අනෙක් එක, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව පිළිබඳව තිබෙන විශ්වාසය බිඳිලා ගිහිල්ලා. මොකද, ජන වරමක් නැහැ. එහෙම නම්, ජන වරමක් නැති මේ පාර්ලිමේන්තුව තුළ ජන වරම නිවැරදිව හදන්න අවශ්‍ය වැඩ පිළිවෙළ වර්තමාන ආණ්ඩුව තුළින් ගොඩ නැඟිය යුතුය කියන බලපෑම කරන්නත් මේ සමුගැනීම තුළ එක පැත්තකින් මම බලාපොරොත්තු වෙනවා, ගරු කථානායකතුමනි. අලුත් පාර්ලිමේන්තුවක් හදන්න මැතිවරණයක් තියන්න. ජනතාව කැමති වන; රටේ පුරවැසියා කැමති වන දේශපාලන ජයග්‍රහණයට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කර දිය යුතුයි කියන කාරණයත් මගේ මේ තීන්දුව තුළ තිබෙන බව මම ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් කියන්නේ මේකයි. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, ඔබතුමා නායකයෙක් විතරක් නොවෙයි, මට පියෙකු හැටියටත් පිහිට වෙලා තිබෙනවා. ගරු නායකතුමනි, මම අද සතුටු වෙනවා, ඔබතුමා ගැන. මේ රටේ බොහෝ දෙනා දේශපාලන වශයෙන් රඟපෑම් කළා. ඒ අය මේ රටේ දරුවන්ගේ පියවරුන් හැටියට කටයුතු කරන්න බොහොම වික්‍රමාන්විත ක්‍රියා කළා. දරුවන් වඩා ගත්තා, උම්මා දුන්නා. හැබැයි, දරුවන්ට සැලකුවේ නැහැ. නමුත්, ඔබතුමා අද මගේ දරුවෝ තුන්දෙනාටත් පියා වෙන්න පුළුවන් කියන වැඩ පිළිවෙළ මේ සමාජය තුළ පෙන්වා තිබෙනවා. මොකද, ඔබතුමා පිතෘත්වය ලබාගත් පියෙකු හැටියට අද දරු සුරතල් බලන නායකයෙක්. ඒ නිසා මට ලොකු විශ්වාසයක් තිබෙනවා, ඔබතුමා අනාගතයේ මේ රටේ දරුවන් සහ අපේ දරුවන් බලා ගනියි කියලා. මම ඒ ගෞරවය ඔබතුමාට දෙන්නේ ඇයි? මම දකිනවා, ඔබතුමා දැන් හවස 5.00, 6.00, 7.00 වන කොට සභාවේ නැති බව. හොයා බලන කොට ගරු කථානායකතුමනි, අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා පියෙකු හැටියට දරුවෙකු නළවන, දරු සුරතල් බලන තැනට ගොඩ නැඟිලා තිබෙනවා.

සමගි ජන බලවේගය තුළ තිබෙන අඩන්තේට්ටම්, පීඩන නිසා නොවෙයි හුදෙක්ම මම මේ තීරණය ගන්නේ. ඔබතුමා උදේ ඉඳන් මගේ ළඟට ඇවිල්ලා කථා කළා. ගරු නායකතුමනි, මම ඔබතුමාට, ඔබතුමාගේ පක්ෂයට කිසිම කැළැලක් වන, අහිතක් හිතන කිසිදු වැඩ පිළිවෙළක් කරන්න දෙන්නේ නැහැ. මොකද, ඔබතුමාත් එක්ක මම ඉන්නවා. මම මගේ දේශපාලනය කරන්නේ සමගි ජන බලවේගයෙන්. සමගි ජන බලවේගය හැර දේශපාලන පක්ෂයක් මට නැහැ. මම ඉන්න තැන, හිටපු තැන හැමදාම හොඳට හිටියා. ඒක මගේ ප්‍රතිපත්තිය. එතැනින් මට අසාධාරණයක් - එවැනි කිසිවක් - නොවුණු බව මම මේ අවස්ථාවේ කියනවා. මම දන්නේ නැහැ, හෙට එළි වෙනකොට ජනමාධ්‍ය තුළ මොනවා කියාවිද කියලා.

ගරු කථානායකතුමනි, පුවත්පත් කියවන කොට, ඔබතුමාට, අපට, අපේ දරුවන්ට මහ පාරේ බැහැලා යන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. පුවත්පත් විස්තර කියවන නිවේදකයන් මේ 225දෙනාට ශාප කරන විධිය, ප්‍රවෘත්ති කියවන විධිය බලන්න. මම දන්නේ නැහැ, වජිරින්ද විජේසිරිගේ මේ කථාව පිළිබඳව හෙට උදේ මොනවා කියාවිද කියලා. මොනවා කිව්වත්, මට සතුටක් තිබෙනවා, මගේ හෘදය සාක්ෂියට අවංකව දැනෙනවා, මේ රටේ අනාගත දරුවාගේ වගකීම භාර ගන්න පුළුවන් නායකයෙක් ඉන්නවා කියලා. එතුමා මේ රටේ දේශපාලන බලය නිර්මාණය කරන වෙලාවට මට හැකියාවක් තිබුණොත් මගේ දේශපාලනය නැවත කරන්න කටයුතු කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, මේ රටේ ජනතාව හැමදාම ඔබතුමාගේ වැඩ පිළිවෙළ දැක්කේ කොහොමද? අර සින්දුවක් තිබෙනවා, පිට කවරය බලලා තීන්දු ගත්තා කියලා. එහෙම නොවෙයි. මම කියනවා, සජිත් ප්‍රේමදාස මහත්මයාගේ සම්පූර්ණ කථාව බලන්න කියලා. අපි ඒ කථාව බලලා තිබෙනවා. ඒ වෙනුවෙන් කටයුතු කරන්න කියන ඉල්ලීම මම කරනවා. මේ කාරණාව වැඩියෙන් කිව්වේ, එතුමාට ලොකු වේදනාවක්, දුකක් තිබෙන බව මට පෙනෙන නිසා. මේ ආරංචිය ඔබතුමා කියලාද කොහේදෝ උදේ ඉඳලාම මා ළඟට ඇවිල්ලා කථා කළා. නමුත් මම සතුටෙන් තමයි මේ තීන්දුව ගන්නේ, ගරු කථානායකතුමනි.

මේ 225දෙනා යහපත් කරන්න කියන ඉල්ලීම තමයි මම පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියගෙනුත් කළේ. මහ ලේකම්තුමියනි, ඔබතුමියට නිලධාරීන් හැටියට ලොකු වගකීමක් තිබෙනවා. මේ 225දෙනා මේ වැඩේ හරියට කළොත් මම හිතනවා, මේ රට ගොඩනහා ගන්න පුළුවන් කියලා. ඔබේ දරුවා, මගේ දරුවා, මේ සේවකයන්ගේ දරුවෝ සමාජය තුළ විශාල වශයෙන් දුක් විඳිනවා, ගරු කථානායකතුමනි. ඒ ප්‍රශ්නය විසඳන්න පුළුවන් යහපත්, ගුණවත්, නීතිගරුක 225දෙනෙකු හදන්න පුළුවන් හයිය ඔබතුමාටත්, මහ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන්ටත් ලැබෙන්න කියා මම ප්‍රාර්ථනා කරනවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම, මගේ ඉල්ලා අස්වීමේ ලිපිය නීත්‍යානුකූලව පිළිගෙන මට සමු ගන්න අවස්ථාව ලබා දෙන්න කියලාත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ඔබතුමාට සුබ පතනවා.

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත
### பிணைப்பொறுப்பளிக்கப்பட்ட கொடுக்கல்வாங்கல்கள் சட்டமூலம்
### SECURED TRANSACTIONS BILL

"සුරක්ෂිතලත් ගනුදෙනු ලියාපදිංචි කිරීමේ අධිකාරිය පිහිටුවීම මගින් වංචල දේපළ පිළිබඳ සුරක්ෂිතලත් ගනුදෙනු විධිමත් කිරීම පිණිස වූ ආයතනික රාමුවක් ඇති කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; එම අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සඳහන් කිරීම සඳහා ද; ස්වකීය ණයකරුවන්ගේ වංචල දේපළ පිළිබඳ තරගකාරී සුරකු අයිතිවාසිකම් ඇති ණය හිමියන් අතර ප්‍රමුඛතා නිශ්චය කිරීම උදෙසා විධිවිධාන සැලැස්වීම සඳහා ද; සුරකු ගිවිසුම්වල පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් සඳහන් කිරීම සඳහා ද; වංචල දේපළවල සුරකු අයිතිවාසිකම් පිළිබඳ රෙජිස්ටරයක් පිහිටුවා පවත්වාගෙන යාමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ඉවත් කිරීම සඳහා ද; සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.***

***2024 ජනවාරි 23වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2024 சனவரி 23, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Minister of Finance, Economic Stabilization and National Policies;*

*to be read a Second time upon Tuesday, 23rd January, 2024 and to be printed and to be referred to the Committee on Public Finance.*

### කාලාවරෝධ (සංශෝධන) පනත් කෙටුම්පත
### காலவிதிப்பு (திருத்தம்) சட்டமூலம்
### PRESCRIPTION (AMENDMENT) BILL

"(68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.***

***2024 ජනවාරි 23වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2024 சனவரி 23, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Minister of Finance, Economic Stabilization and National Policies;*

*to be read a Second time upon Tuesday, 23rd January, 2024 and to be printed and to be referred to the Committee on Public Finance.*